කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

පළමු වසර පරීක්ෂණය -2018/2019

(දෙවන සෙමෙස්තර අවසාන)

ECN 1204 : ලෝක ආර්ථික සංවර්ධනය හා ශ්‍රී ලංකාව

කාලය: පැය දෙකයි (02).

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න.

---

**ප්‍රශ්න අංක 1**

15 වන සියවසේදී අඩු දියුණු මට්ටමක පවතී බ්‍රිතාන්‍යයේ ප්‍රධාන අපනයනය වූයේ ප්‍රාථමික වූල් ය. එහෙත් 18 වන සියවස වන විට ලොව ප්‍රබලතම ආර්ථිකය බවට බ්‍රිතාන්‍යය ආර්ථිකය පත්විය.

i) කාර්මික විප්ලවයක් ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 5)

ii) බ්‍රිතාන්‍යය කාර්මික විප්ලවයට හේතු වූ පූර්ව කොන්දේසි විස්තර කරන්න. (ලකුණු 10)

iii) "බ්‍රිතාන්‍යය අත්පත් කරගත් තාක්ෂණික දියුණුව, පසු කාලීනව නිදහස් වෙළඳ තන්ත්‍රයක් (free trade regime) ඇති කිරීමට මුල්වූවත්, එම තාක්ෂණික (හා ආර්ථික) දියුණුව අත්පත් කරගැනීමට හේතු වූයේ දිගුකාලයක් පුරා පවතී ඉහල තීරුබදු තන්ත්‍රයයි. (Bairoch, 1993 p. 46)"
බ්‍රිතාන්‍යය කාර්මික විප්ලවයට රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය මැදිහත්වීම් මගින් සිදුකල කාර්යභාරය විමසන්න. (ලකුණු 10)

**ප්‍රශ්න අංක 2**

සංවර්ධන න්‍යායන් මගින් විස්තර වන්නේ සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේ උපායමාර්ග හා සමහර රටවල් ඌන සංවර්ධනයෙන් පෙළීමට හේතු වන කරුණු ය.

i) ආර්ථික වර්ධනය පිළිබඳ සම්භාව්‍යය ආර්ථික විද්‍යාවේ (Classical economics) මතයන් විස්තර කරන්න. (ලකුණු 8)

ii) කාල් මාර්කස්ගේ දේශපාලන ආර්ථික විද්‍යා න්‍යායට (Karl Marx's political economic theory) එරෙහිව ඇති ප්‍රධාන විවේචන මොනවා ද? (ලකුණු 8)

iii) "නව-මාර්ක්ස්වාදී පරායත්තතා න්‍යාය (Neo-Marxist dependency theory) ශ්‍රී ලංකාව වැනි යටත් විජිත ඉතිහාසයන් සහිත රටවල ඌන සංවර්ධිත තත්වයන් විග්‍රහ කිරීමට යොදාගත හැකිය."
මෙම කියමන සමඟ ඔබ එකගවේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 9)

**ප්‍රශ්න අංක 3**

කෘෂිකර්මාන්තය ආර්ථික වර්ධය උදෙසා විශේෂිත කාර්යභාරයක් සිදු කරයි.

i) කෘෂි විප්ලවයක් යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 5)

ii) ආර්ථික සංවර්ධනයට කෘෂිකර්මාන්තය මගින් ඉටුවන කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 10)

iii) "හරිත විප්ලවය නිසා තිරසාර සංවර්ධනයට ධනාත්මක හා ඍණාත්මක බලපෑම් ඇතිවිය."
හරිත විප්ලවය නිසා තිරසාර සංවර්ධනයට වන බලපෑම් විවේචනාත්මකව විමසන්න. (ලකුණු10)

අනෙක් පිට බලන්න.

**ප්‍රශ්න අංක 4**

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට ඇති ප්‍රධාන අභියෝග මොනවාදැයි සාකච්ඡා කර එම අභියෝග ජය ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (අවම ලෙස අභියෝග 04ක් වත් ලියා දක්වන්න). (ලකුණු 25)

**ප්‍රශ්න අංක 5**

19 වන සියවසේ සිදුවූ වතු කෘෂිකර්මයේ වර්ධනය, ශ්‍රී ලංකාවේ ද්විත්ව අපනයන ආර්ථිකයක් බිහි කල අතර එහි බලපෑම දිගුකාලීන විය.

i) "අපනයන ආර්ථිකය" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 5)
ii) ශ්‍රී ලංකාවේ යටත් විජිත සමයේ වූ ද්විත්ව අපනයන ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරන්න. (ලකුණු 10)
iii) ශ්‍රී ලංකාවේ යටත් විජිත සමයේ වූ ද්විත්ව අපනයන ආර්ථික රටාව නිසා හටගත් හා 1948 නිදහස ලැබෙන විට හා ඊට පසුවත් පවති, ගැටළු මොනවාදැයි විමසන්න. (ලකුණු 10)

**ප්‍රශ්න අංක 6**

පුළුල් පරාසයක විහිදෙන විවිධ වූ න්‍යායාය හා දෘෂ්ටිවාදයන් දැරූ දේශපාලන පක්ෂ විසින් සිදු කල ආර්ථික ප්‍රතිපතිකරණ අත්හදා බැලීම්වලට, නිදහසෙන් පසු ශ්‍රී ලංකාව තෝතැන්නක් විය.

i) නිදහසෙන් පසු, ශ්‍රී ලංකාවේ බලයට පත් මධ්‍ය වාමවාදී (left of center) හා මධ්‍ය දක්ෂිණාංශික (right of center) රජයන් විසින් අනුගමනය කල ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් සැකවින් විභාග කරන්න. (ලකුණු 10)
ii) නව ලිබරල්වාදී (වොෂින්ටන් එකඟතා ප්‍රතිපති වැනි) ප්‍රතිපත්ති, ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට කෙතරම් ප්‍රතිඵලදායකදැයි විවේචනාත්මකව විමසන්න. (ලකුණු 15)

**ප්‍රශ්න අංක 7**

"ආවෘත ආර්ථිකයක මූලික පරමාර්ථය වන්නේ දේශීය පාරිභෝගිකයාට අවශ්‍ය සියලුම දෑ රට තුළින්ම සපයා ගැනීමයි."

i) ශ්‍රී ලංකාවේ පැවති ආවෘත ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)
ii) ආනයන ආදේශන ප්‍රතිපති උපායමාර්ගවල වාසි සහ දුර්වලතා විවේචනාත්මකව විමසන්න. (ලකුණු 15)

**ප්‍රශ්න අංක 8**

"විවෘත ආර්ථිකයක් ඇති රටක ජීවත්වන්න පුරවැසියන්ට අත්පත් වන යම් වාසි පවතී."

i) ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)
ii) විවෘත ආර්ථික ප්‍රතිපත්ති තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට හැකි වුයේදැයි කෙටියෙන් විමසන්න. (ලකුණු 15)

**ඊලග පිටුව බලන්න.**

ප්‍රශ්න අංක 9

පහත දැක්වෙන ද; අතුරින් ඕනෑම <u>තුනක් (03)</u> තෝරාගෙන සංකල්ප අතර වෙනස්කම් පැහැදිලි වන අන්දමින් විස්තරාත්මක සටහන් ලියන්න. (සෑම කොටසකටම සමාන ලකුණු හිමිවේ)

i) අභ්‍යාන්තරාභිමුඛ (inward looking) ආර්ථික ප්‍රතිපත්ති හා බහිරාභිමුඛ (outward looking) ආර්ථික ප්‍රතිපත්ති
ii) ධනවාදය හා වැඩවසම් ක්‍රමය (Capitalism and Feudalism)
iii) ඉපිලීම (take off) හා පරිනත අවධිය (drive to maturity) [රෝස්ටෝගේ වර්ධන අවධි න්‍යායේ එන]
iv) කාල් මාර්ක්ස්ගේ නිෂ්පාදන බලය (forces of production) හා නිෂ්පාදන සබඳතා (production relations)
v) වානිජවාදය (Mercantilism) හා නිර්බාධීකරණය (Liberalization)
vi) කාබනික වගාවේ (organic farming) වාසි හා අවාසි

-----------------------------------------------ප්‍රශ්න පත්‍රයේ අවසානය-----------------------------------------